(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **124**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2026 ජනවාරි 21** බදාදා **පූ.භා. 9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **කේ.ඩී. ලාල් කාන්ත මහතා,** කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අර්කම් ඉල්යාස් මහතා,** බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත ජයවීර මහතා,** ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරවින්ද සෙනරත් මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිනිඳු සමන් හෙන්නායක මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා

ගරු ජේ.සී. අලවතුවල මහතා

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු බී. ආරියවංශ මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු තාහිර් මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු චන්දන සූරියආරච්චි මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදන කරන ලදී:—

I

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, ම'විසින් 2026 ජනවාරි 20 දින 'කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන)' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

II

"2026 ජනවාරි 20 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම් තුනට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXXIII, XXXIV, XXXV සහ XXXVI කොටස්, සිව්වැනි කාණ්ඩයේ XIX සහ XX කොටස්, පස්වැනි කාණ්ඩයේ VIII සහ IX කොටස් සහ හයවැනි කාණ්ඩයේ XXV කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 හා 2024 වර්ෂ සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා; සහ

(iii) 2024 වර්ෂය සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ජනමාධ්‍ය අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2024 වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2021 හා 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) නිට්ටඹුව, කෝන්ගස්දෙණිය, පනාවල පාර, නො. 88/ඒ/1 දරන ස්ථානයෙහි පදිංචි ආර්.පී.එන්.ආර්. ගුණවර්ධන මහතාගෙන් ලැබුණු 2025.10.23 දිනැති පෙත්සම; සහ

(ii) වැලිවේරිය, ඇටිකෙහෙල්ගල්ල, අංක 137/1/1 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.පී. විමලරත්න මහතාගෙන් ලැබුණු 2025.07.07 දිනැති පෙත්සම

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා විසින් පිළිගන්වන ලදී.

(2) හුංගම, මුලන, 'පියුමි' යන ලිපිනයෙහි පදිංචි එම්.කේ. ආනන්ද මහතාගෙන් ලැබුණු 2025.05.27 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(3) තලවකැලේ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ සේවයේ නියුතු රාජික නිරෝෂන් ගමගේ මහතාගෙන් ලැබුණු 2025.07.21 දිනැති පෙත්සම ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව:** ගරු ගයන්ත කරුණාතිලක මහතා, ගරු දිලිප් වෙදආරච්චි මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකා ඉතිහාසයේ දරුණුම ඛේදවාචකය ලෙස සැලකෙන දිට්වා සුළි කුණාටුවෙන් සිදු වූ ජීවිත හානි, දේපළ හානි හා ජනතාවට සිදුව ඇති හානි මේ දක්වා තක්සේරු කර නොමැති හෙයින්ද;

මෑත කාලීනව මෙවන් ව්‍යසන දෙකක් එනම්, පාස්කු ඉරුදින ප්‍රහාරය සහ ආර්ථික අර්බුදය ඇති වූ අවස්ථාවලදී ද පාර්ලිමේන්තු විශේෂ කාරක සභා පත් කිරීමට කටයුතු කරන ලද හෙයින්ද;

මේ දක්වා සිදුව ඇති ආපදා අතුරින් මෙම ආපදාව සුවිශේෂ යැයි විශ්වාස කරන හෙයින්ද;

මෙම අතිශය ඛේදනීය තත්ත්වය සම්බන්ධයෙන් කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා විදෙස් මාධ්‍ය විටින් විට අනතුරු අඟවා පුරෝකථන සිදු කර තිබූ බව මේ වනවිට පාර්ලිමේන්තුවේදී අනාවරණය වී ඇති හෙයින්ද;

මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා අදාළ පාර්ශ්වයන් පූර්ව සූදානමකින් සිටියේ නම්, සිදුව ඇති හානිය සැලකිය යුතු ප්‍රමාණයකින් වළක්වා ගැනීමට හැකියාව තිබූ හෙයින්;

දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතු ය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද,

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

**7. කල් තැබීම ("දිට්වා" සුළි කුණාටුවෙන් පසු රටේ තත්ත්වය):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය" යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

(පූ.භා. 10.59 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි පරිසර අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.48 ට ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.)

"ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.09 ට ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2026 ජනවාරි 22 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.